A CENTURY OF HEALING THE NATION

# GMOA

ESTABLISHED IN
1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 011 2580886/ 0718552552 Fax : 011 2503586

Email : office@gmoa.lk Web : www.gmoa.lk

1926 - 2026
GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION


2026.07.02

මාධ්‍ය නිවේදනය

**සීමාවාසික වෛද්‍ය පත්වීම් ප්‍රමාදය හේතුවෙන් සෞඛ්‍ය සේවාව බිඳවැටීමේ අවධානමක.**

මේ වන විට රට පුරා ඩෙංගු රෝගය අධි වසංගත තත්ත්වයක් කරා යොමු වෙමින් පවතින අතර, 2026.07.01 වන විට වාර්තා වී ඇති සමස්ථ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 56422 කට ආසන්න ප්‍රමාණයක් වන අතර අවාසනාවන්ත ලෙස ඩෙංගු මරණ 35 කට ආසන්න ප්‍රමාණයක් 2026 වසර තුලදී මේ වන විට වාර්තා වී ඇත.

රට පුරා විශේෂඥ වෛද්‍යවරු විශාල ප්‍රමාණයක් මේ වන විට ඉතා දැඩි කැපවීමකින් දිවා රෑ නොතකා මහත් පරිශ්‍රමයක් දරමින් තමා සිදු කල යුතු රාජකාරි ප්‍රමාණයට වඩා හතර පස් ගුණයක රාජකාරි ප්‍රමාණයක් සිදු කරමින් ඩෙංගු රෝගීන් සුවපත් කිරිමෙහිලා කැප වී සිටිති.

ඊට නොදෙවෙනි ලෙස රට පුරා සේවය කරන ශ්‍රේණි වෛද්‍යවරුන් සහ සීමාවාසික වෛද්‍යවරුන් ඩෙංගු රෝගීන් වෙනුවෙන් දැඩි ලෙස කැපවෙමින් ඔවුන් සුවපත් කිරිමේ නියැලි සිටියි.

එමෙන්ම හෙද, හෙදියන් ඇතුලු අනිකුත් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයන්ගෙන් රෝගී සත්කාර සේවා සඳහා ලැබෙන සහය ද අතිමහත් බව මතක් කර සිටිය යුතුය.

මෙම සියලු කණ්ඩායම් වෙත ඔවුන්ගේ කැපවීම් සම්බන්ධයෙන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ හෘදයාංගම ස්තූතිය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු.

මෙම කාණ්ඩ අතුරින් අමතක කල නොහැකි ප්‍රධානතම සහ වැදගත්ම ඉදිරිපෙළ කාර්ය භාරයක් ඉටු කරනුයේ සීමාවාසික වෛද්‍යවරුන් විසිනි.

මේ වන විට මෙම සීමාවාසික පුහුණුව ලබන වෛද්‍යවරුන් කණ්ඩායම් අතුරින් 2025.06.30 සීමාවාසික පුහුණුව ආරම්භ කරන ලද 545 ක වෛද්‍යවරුන් ප්‍රමාණයකගේ එම පුහුණුව 2026.06.30 දිනෙන් අවසන්ව ඇත. නමුත් යම් අධිකරණ කටයුත්තක් නිසා මෙම කණ්ඩායමෙන් පසුව සීමාවාසික පුහුණුවට අලුතින් එකතුවීමට නියමිත වෛද්‍ය කණ්ඩායම රෝහල් වලට අනුයුක්ත වීම තවමත් සිදු වී නැත.

ඩෙංගු රෝගය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් රෝහල් ධාරිතාවය පවා ඉක්ම ගොස් ඇති වපසරියක, සීමාවාසික වෛද්‍යවරුන්ගේ සේවයට වාර්තා කිරීමේ ප්‍රමාදයක් ඇති අතර ඒ නිසා ශ්‍රී ලාංකීය සෞඛ්‍ය පද්ධතිය බිඳ වැටීමේ අවදානමකට ඉදිරියේදි මුහුණ දීමට නියමිතය. එම නිසා ශ්‍රී ලාංකීය රෝගී ජනතාව වෙනුවෙන් මෙම වසංගත තත්ත්වය තුල සෞඛ්‍ය සේවාව මුහුණ දී ඇති අවදානම පිළිබඳව ගරු අධිකරණයට හැකි ඉක්මනින් කරුණු වාර්තා කර සීමාවාසික පුහුණුව අපේක්ෂිත වෛද්‍ය උපාධිධාරින් හට, ඔවුන්ට අදාල සීමාවාසික පුහුණුව ලබා දීමට කටයුතු කරන මෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ බලධාරීන්ගෙන් අප ඉල්ලා සිටින්නෙමු.

ස්තූතියි.
මීට විශ්වාසී,

වෛද්‍ය යු. කේ. බී. වරකාගොඩ,
ලේකම්.

වැඩිදුර විස්තර රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ මාධ්‍ය කමිටුවෙන් -

| | | |
|---|---|---|
| වෛද්‍ය චමිල් විජේසිංහ | - | 0717080041 |
| වෛද්‍ය පාලිත රාජපක්ෂ | - | 0718480300 |
| වෛද්‍ය හංසමාල් වීරසූරිය | - | 0776549339 |
| වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ | - | 0777829001 |
| වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ | - | 0716812160 |
| වෛද්‍ය ආර් .තනිගවාසන් | - | 0772369608 |
| වෛද්‍ය අජන්ත රාජකරුණා | - | 0766736296 |
| වෛද්‍ය වාරුනි කොහොඹන්ගේ | - | 0714410467 |
| වෛද්‍ය අන්ෆාස් ෆාරුක් | - | 0771115117 |
| වෛද්‍ය සංජීව තල්ගහගොඩ | - | 0716173330 |
| වෛද්‍ය ලසිත් ධම්මික | - | 0777611420 |